**බිංගිරිය ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 ජූනි 13 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බිංගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2018 වර්ෂයට අදාල වූ රු.5,571,477 ක ඉදිකිරීම් පිරිවැයක් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාල රු.2,128,423 ක ඉදිකිරීම් පිරිවැය ප්‍රාග්ධනගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු වටිනාකම රු.601,117 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 33 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ගිණුමේ ශේෂය රු.1,000,000 ක් අඩුවෙන් දැක්වීම නිවැරදි කිරීමේ සටහන් නිවැරදි ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල හා අවිනිශ්චිත ගිණුම රු.2,000,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සභාවට අයත් අක්‍රීය බැංකු ගිණුම් 02 ක පැවති ශේෂය රු.1,001,767 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 04 ක මූල්‍ය ප්‍රකාශන හා අදාළ ලේඛනවල ශේෂ අතර එකතුව රු.66,508,360 ක නොසැසඳීම් පැවතුණි.

### 1.3.3 අවිනිශ්චිත ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ රු.5,360,283 ක් වූ හර ශේෂයක් පැවතුණි.

### 1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

-------------------------------

(අ) ලැබියයුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.69,595,424 ක් වූ ලැබියයුතු ගිණුම් ශේෂයෙන් රු.268,550 ක් වර්ෂ 01 ට වැඩි වර්ෂ 03 ට අඩු ශේෂයන් වූ අතර රු.2,168,559 ක් වර්ෂ 03 ට වැඩි ශේෂයන් විය. තවද රු.14,572,253 ක ශේෂයන්ට අදාළව කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.69,272,758 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂයෙන් වර්ෂ 01 ට වැඩි වර්ෂ 03 ට අඩු රු.1,938,138 ක් හා වර්ෂ 03 ට වැඩි රු.3,066,033 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර, රු.9,968,039 ක ශේෂ සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.244,191,119 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| 154 (1) වගන්තිය | 1,522,793 | සමාලෝචිත වර්ෂයේදී වෙන්දේසිකර විකුණා තිබූ ඉඩම් 10 කින් විකුණුම් මිලෙන් සියයට 01ක් අයකර නොගෙන ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන් සියයට 01ක් පමණක් අයකරගෙන තිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) 5 (6) රීතිය | 67,660,118 | නියමිත කාල සීමාව තුළ සභාව වෙත අයවිය යුතු සියළුම ආදායම් හා වෙනත් ගාස්තු එකතුකරගෙන නොතිබුණි. |
| (ii) 218 රීතිය | 164,711,550 | සභාවේ සියළු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ සමීක්ෂණය කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,457,616 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,015,363 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟහිටි ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම් | 2017 බිල්කළ ආදායම් | 2017 රැස්කළ ආදායම් | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම් | 2016 බිල්කළ ආදායම් | 2016 රැස්කළ ආදායම් | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,319,164 | 4,298,814 | 4,156,815 | 209,953 | 2,967,000 | 3,865,000 | 4,031,000 | 67,934 |
| (ii) | බදු කුලී | 13,928,798 | 14,662,448 | 14,576,193 | 969,738 | 14,050,000 | 12,428,000 | 12,094,000 | 883,483 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 380,000 | 790,538 | 789,538 | 1,000 | 355,000 | 878,000 | 878,000 | - |
| (iv) | වෙනත් ආදායම් | 74,163,500 | 72,047,353 | 72,047,353 | 66,222,636 | 75,257,000 | 72,437,000 | 45,103,000 | 55,917,294 |
| | එකතුව | 91,791,462 | 91,799,153 | 91,569,899 | 67,403,327 | 92,629,000 | 89,608,000 | 62,106,000 | 56,868,711 |

සටහන

සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම තුළ ඉකුත් වර්ෂවල හිඟ ආදායමෙන් රැස් කිරීම්ද ඇතුළත්ව තිබුණි. සභාව විසින් ඉදිරිපත් කර තිබුණු ඉහත ආදායම් හා මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම් අතර නොසැසඳීම් පැවතුණි.

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

-----------------------------------------

සමාලෝචිත වර්ෂයේ බිල් කළ ආදායම් රුපියල් මිලියන 91.8 කින් සහ ඉකුත් වර්ෂවල හිඟ ආදායම් රුපියල් මිලියන 56.8 කින් රැස්කළ ආදායම රුපියල් මිලියන 91.6 ක් විය. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 56.8 ක හිඟ ආදායම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 67.4 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**2.2.3 කුලී**

-----

ඉකුත් වර්ෂය අවසානයට රු.883,483 ක් වූ හිඟ කුලී ආදායම සමාලෝචිත වර්ෂය අවසානයට රු.969,738 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**2.2.4 වෙනත් ආදායම්**

-----------------

වර්ෂ ගණනාවක සිට අය නොවී පවතින රු.203,095 ක් සහ අගරු චෙක්පත් සඳහා රු.53,717 ක් අයකරගෙන නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.11,500,000 ක් හා රු.15,000,000 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කාර්යසාධනය**

---------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 24 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වනවිට කාරණා 12 කට අදාලව පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

---------------------------------------------------

භෞතික ප්‍රගති වාර්තා අනුව රු.2,651,762 ක ප්‍රතිපාදනයකින් මාර්ග 28 ක බොරළු ඇතිරීමට සැලසුම් කර තිබුණද, ඉන් මාර්ග 21 ක බොරළු අතුරා නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

සමාලෝචිත වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් රු.4,533,521 ක පුනරාවර්තන වියදම් සහ රු.1,149,660 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම්14,210 ක් නිපදවා තිබුණු අතර රු.108,384 කට පොහොර කිලෝ ග්‍රෑම් 13,548 ක් අලෙවි කර තිබුණි.

(ඈ) පාරිසරික ගැටළු

--------------------

සමාලෝචිත වර්ෂයේදී සංවර්ධනය කර විකුණා තිබුණු අක්කර 38 රූඩ් 01 පර්චස් 27.07 ක් එළිපෙහෙලි කිරීමෙන් ඇතිවන පාරිසරික බලපෑම අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය

(i) "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත්ව නොතිබුණු බැවින් තිරසර සංවර්ධන අරමුණු 17 ට යොමු වූ ඉලක්ක වෙත සභාවේ ක්‍රියාකාරකම් සම්බන්ධ කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) තිරසර සංවර්ධන අරමුණු 15 හි සඳහන් වූ භූගෝලීය පරිසර පද්ධතියේ තිරසර භාවිතය, කාන්තාරීකරණයට එරෙහිව කටයුතු කිරීම, ඉඩම් හායනය නැවැත්වීම හා පුනරුත්ථාපනය සහ තිරසර සංවර්ධන අරමුණු අංක 12 හි සඳහන් තිරසර පාරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම යන කාරණයන්ට අහිතකර ලෙස බලපාන පරිදි ඉකුත් වර්ෂ කිහිපයක සිට දිගින් දිගටම පොල් ඉඩම්, නිවාස දේපල සඳහා සංවර්ධනය කිරීම් නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේදී පමණක් අක්කර 39 කට වැඩි පොල් ඉඩම් ප්‍රමාණයක් නිවාස දේපල සඳහා සංවර්ධනය කර තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු බිංගිරිය සහ බෝවත්ත වෙළඳ සංකීර්ණවල කාමර 02 ක මාසික කුලිය තක්සේරු වාර්තාවක් මත තීරණය කර නොතිබුණි.

(ආ) කීමනී ක්‍රමයට බදු දී තිබූ බෝවත්ත වෙළඳ සංකීර්ණයේ කඩ කාමර ඉවත් කර නව සංකීර්ණයේ කඩ කාමර ලබාදීමේදී පැරණි කඩ හිමියන් 06 දෙනෙකුට නව කඩ කාමර ලැබී නොතිබුණි.

(ඇ) සභාව සතු ටිපර් රථයේ මාස 03 කින් නිමකළ හැකි රු.1,676,520 ක අළුත්වැඩියාවක් වර්ෂ 03 ක කාලයක් පෞද්ගලික ගරාජයක් තුළ නිෂ්කාර්යව තැබීම හේතුවෙන් හානියට පත්වූ කොටස් අළුතින් දැමීමට රු.201,400 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත ද්විතීයික තනතුරු 27 කින් 13 ක් පුරප්පාඩුව පැවතුණි. අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කළ සංවර්ධන නිලධාරීන් 13 ක් සහ පෙර පාසැල් සහායකයින් 04 ක් සභාවේ සේවයට යොදවා තිබුණි.

(ආ) කාර්යාල කාර්යය සහායක නිලධාරිනියක් සඳහා 2013 දෙසැම්බර් පත්වීම් දිනසිට කළමනාකරණ සහකාර තනතුරුවලට අදාළ රාජකාරි පැවරීම් කර තිබුණි.

(ඇ) සභාවේ සේවයේ නියුතු III ශ්‍රේණියේ කාර්යාල කාර්ය සහායිකාවක ආයතන සංග්‍රහයේ XII පරිච්ජේදයේ 23.1 වගන්තිය ප්‍රකාරව 2017 මාර්තු 02 දින සිට 2017 මාර්තු 06 දින දක්වා නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව දිවයිනෙන් බැහැරව ගොස් තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

--------------------------

### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

--------------------------------

ගොඩනැගිලි 27 ක තොරතුරු සභාවේ තිබුණද, ඒ සම්බන්ධයෙන් පී.එස් 46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි.

### 3.4.2 පවරා නොගත් වත්කම්

--------------------------

සභාව භාවිතා කරන ටිපර් රථය, කෘෂ කැබ් රථය සහ අත් ට්‍රැක්ටරය සභාවට පවරාගෙන නොතිබුණි.

### 3.4.3 නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

------------------------------------

වටිනාකම රු.374,136 ක් වූ කුට්ටි ගල් මැෂින් 02 ක් වර්ෂ 04 ක කාලයක සිට නිශ්කාර්යව පැවතුණි.

### 3.4.4 වාහන උපයෝජන

--------------------

සභාව සතු ටිපර් රථයේ රේඩියේටරය හා වතුර කුලින් පද්ධතිය අළුත්වැඩියාව සඳහා වූ රු.55,000 ක ඇස්තමේන්තුවෙන් වතුර කුලින් පද්ධතිය පමණක් අළුත්වැඩියා කර රේඩියේටරය අළුත්වැඩියාව සඳහා රු.24,000 ක අමතර ඇස්තමේන්තුවක් මත අළුතින් රේඩියේටරයක් දැමූ බව සඳහන් කර ගෙවීම් කර තිබුණි. මෙම ටිපර් රථය අළුත්වැඩියා කිරීමේ වැඩ විෂයය අංක 02 අනුව වාහනයේ මුහුණ අළුතින් සවි කිරීමට රු.280,000 ක් ගෙවා තිබුණි. 2017 නොවැම්බර් 23 දින ටිපර් රථය භෞතිකව පරීක්ෂා කිරීමේදී එහි ඩෑෂ් බෝඩ් එකෙහි තීන්ත ආලේපනය කර තිබුණි. නව මුහුණක් සවි කළේනම් තීන්ත ආලේප කිරීමක් අවශ්‍ය නොවන අතර ඉවත් කරන ලද වාහනයේ ඉදිරි මුහුණ සභාවට භාරගෙන නොතිබුණි.

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 සැපයීම් හා සේවා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තාක්ෂණික කමිටු නිර්දේශ මත රු.10,500,000 ක අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරු ප්‍රතික්ෂේප කර රු.11,913,000 ක් වූ මිලකට සභාවට බැකෝ ලෝඩරයක් මිලදී ගැනීමේදී රු.1,413,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) සභාවේ ටිපර් රථයේ රු.515,000 ක බාහිර අළුත්වැඩියාව සඳහා මිල කැඳවීම් 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 පරිදි සිදුකර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 ජූනි 13 දින ඉදිරිපත් කර තිබුණි.

### 4.2 අයවැය පාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අයවැයගත නොකළ නිම්වැඩ වටිනාකම රු.19,780,515 ක් වූ සංවර්ධන වැඩසටහන් 24 ක් සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර තිබුණි.

(ආ) වැය විෂයය ව්‍යාපෘති සඳහා අදාල අයවැය ප්‍රතිපාදන සියයට 10 සිට සියයට 100 දක්වා වෙනත් වැය විෂයයන්ට මාරුකිරීම් හා ඉතිරිවීම් සිදුවී තිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරීන් 04 දෙනෙකු පත්කර තිබුණද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුව නොතිබුණි. එබැවින් අභ්‍යන්තර විගණන කටයුතු ස්වාධීන වී නොතිබුණ අතර, අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත යොමු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් නොකිරීම. |
| | (ii) වත්කම් ගිණුම්ගත නොකිරීම. |
| (ආ) වත්කම්/දේපල පාලනය | ගොඩනැගිලි ලේඛනගත නොකිරීම. |
| (ඇ) ණයගැති/ණයහිමි පාලනය | (i) කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම. |
| | (ii) දීර්ඝ කාලයක සිට පැවත එන හඳුනා නොගත් ශේෂ පැවතීම. |
| (ඇ) සැපයීම් හා සේවා | (i) නීති, රීති, හා රෙගුලාසිවලට අනුකූල නොවීම. |
| | (ii) ප්‍රමාද සහිතව සිදුකිරීම. |